**ශීර්ෂය - 178 - පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

**-------------------------------------------------------------------------------------------**

## 1.1 <u>විගණන විෂය පථය</u>

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 16 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 <u>ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම</u>

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටු දායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වාගෙන යාම**

අමාත්‍යාංශය විසින් වැය ලෙජරය විධිමත්ව සහ යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 182,590,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 180,902,958 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,687,042 ක් හෙවත් සියයට 0.92 ක් ඉතිරි වී තිබුණි.

විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 139,098,000 | 138,381,052 | 716,948 | 0.51 |
| මූලධන | 43,492,000 | 42,521,906 | 970,094 | 2.23 |
| එකතුව | 182,590,000 | 180,902,958 | 1,687,042 | 0.92 |

**(ii) අයවැය විචලනය**

**------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) මූලධන වැය විෂයයන් දෙකක් සඳහා සළසා තිබුණු රු. 500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් තුනක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 සිට සියයට 52 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**---------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**----------------------------------------------**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 17801 | 4,000,000 | 3,963,767 | 800,000 | 1,874,700 | 8,000,000 | 5,824,871 |

**(ඈ) අග්‍රිම ගිණුම**

**-------------**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු. 420,507 ක් විය.

**1.4 යහ පාලනය හා ගිණුම්කටයුතුභාවය**

**-------------------------------------**

**1.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.4.2 අභ්‍යන්තර විගණනය**

**---------------------**

2013 දෙසැම්බර් 31 දිනටද අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**--------------------------------------**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/ සමීක්ෂණ මණ්ඩල/ 01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2014 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 අනුකූල නොවීම්

-----------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

--------------------------------------------------

නියදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | **රු.** | |
| **(අ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 1646 | | ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ ඒ ඒ මාසයේ ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1647 (ආ) | | වාහන හා වාහනවලට සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 104 (3) (4) | 785,075 | සිදුවී ඇති අලාභය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවේ හා අවසන් වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතු නමුත් සමාලෝචිත වර්ෂය තුළ සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන්, වාර්තා කිරීමක් සිදුකර නොතිබුණි. |

**(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

**---------------------------**

| | |
|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි ඒ අයි/2002/02 | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**

**---------------------------**

| | |
|---|---|
| 2004 ඔක්තෝබර් 14 දිනැති අංක 174 දරන චක්‍රලේඛය | විසර්ජන ගිණුමේ සටහන I යටතේ ස්ථාවර වත්කම් වර්ග කර නොතිබුණි. |

**1.7 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| තෘතියික මට්ටම | 09 | 03 | 06 |
| ද්විතික මට්ටම | 768 | 230 | 538 |
| ප්‍රාථමික මට්ටම | 21 | 18 | 03 |
| | 804 | 256 | 548 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 548 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.